සැ. යු.- 2010.05.21 දින පළ වූ අංක 1,655 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,656 - 2010 මැයි මස 26 වැනි බදාදා - 2010.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1138 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූනි මස 04 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

**හෝමාගම නව නගර සභාව සංස්ථාපනය කිරීම**

කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය සඳහා හෝමාගම නගර සභාව නමින් නව නගර සභාවක් සංස්ථාපනය කිරීමට ඉදිරිපත් වී ඇති යෝජනාව පිළිබඳව අධ්‍යයනය කර නිරීක්ෂණය හා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා ගරු අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා විසින් කමිටුවක් පත් කර ඇත.

උක්ත කමිටුව විසින් හෝමාගම නගර සභාව සංස්ථාපනය කිරීමෙන් පසුව සංශෝධනය වන හෝමාගම ප්‍රාදේශීය සභාවේ මායිම් විස්තර ඊට අයත් වන ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ද, යෝජිත හෝමාගම නගර සභාවේ මායිම් විස්තර, ඊට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ද නිර්දේශ කළ යුතු ය.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන මහජනතාවගෙන් අදහස් විමසීමට කමිටුව විසින් තීරණය කර ඇති අතර, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට කැමති මහජනතාව, මහජන සංවිධාන හා අනෙකුත් ආයතන සිය ලිඛිත අදහස් හා යෝජනා 2010 ජූනි මස 30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කමිටු ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමු.

වාචික යෝජනා ඉදිරිපත් කිරීමට කැමති අය කමිටු ලේකම් වෙත දන්වා දිනයක් හා වේලාවක් ලබාගෙන 2010 ජූනි මස 22 වැනි දිනට පෙර සිය අදහස් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී 2010 ජූනි මස 28 වැනි දින පෙ.ව. 10.00 සිට ප.ව.2.00 දක්වා වාචිකව කරුණු ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත.

ඒ. ජේ. කරුණාරත්න,
කමිටු සභාපති,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.
දුරකතන අංකය : 011-2855967.

ඩී. එච්. චන්ද්‍රසිරි,
කමිටු ලේකම්,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කොළඹ,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, කොළඹ,
හයිලෙවල් ප්ලාසා, දෙල්කඳ,
නුගේගොඩ.
*දුරකතන අංකය* : 011-2829886.

05-741

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.